## ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය -( ණය අංක 2276 ) 2010

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බවත්ය.

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම රු.1,957,427,257 ක් වූ අතර, පෙර වර්ෂය සඳහා වියදම රු. 3,348,188,529 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පෙර වර්ෂය සඳහා වියදම හා 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 1,028,018,879 | 2,177,518,588 | 4,617,798,960 |
| උපකරණ හා ද්‍රව්‍ය | 885,596,617 | 1,137,040,294 | 3,260,784,032 |
| පොලී ගාස්තු | 43,811,761 | 33,629,647 | 89,089,076 |
| එකතුව | 1,957,427,257 | 3,348,188,529 | 7,967,672,068 |

## 2.2 අරමුදල් උපයෝජනය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 උනට ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| | ආ ස බැ | ශ්‍රී ලං ර | එකතුව |
|---|---|---|---|
| | එ ජ ඩො. මිලියන | එ ජ ඩො. මිලියන | එ ජ ඩො. මිලියන |
| එකඟ වූ දායකය | 46.5 | 24.0 | 70.5 |
| එකතු කළා : විදේශ විනිමය හුවමාරු වෙනස | 2.3 | - | 2.3 |
| පර්පරක ප්‍රතිපාදනය | - | 17.87 | 17.87 |
| | 48.8 | 41.87 | 90.67 |
| 2010 දෙසැම්බර් 31 දක්වා දරන ලද තථ්‍ය වියදම | 43.6 | 28.8 | 72.4 |
| අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස | 89.34 | 68.78 | 79.85 |

## 2.3 අග්‍රිම අරමුදල් ගිණුම

ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තා අනුව සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2010 ජනවාරි 1 දිනට ශේෂය | 227,652 | 26,039,868 |
| විදේශ විනිමය පාඩුව | | (495,582) |
| | 227,652 | 25,544,286 |
| අඩුකළා:- ආපසු ගැනීම් | 179,908 | 20,246,922 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 47,744 | 5,297,364 |

## 3. විගණන නිරීක්ෂණ

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය මගින් සපයන ලද තොරතුරුවලට අනුව, ආරම්භයේදී එ.ජ.ඩො. මිලියන 70.3 ක පිරිවැයකින් උප ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, පසුව එක් උප ව්‍යාපෘතියක් ඉවත් කර තිබුනු අතර, ඉතිරි උප ව්‍යාපෘති 04 සඳහා වූ පිරිවැය සංශෝධනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතියේ මුළු පිරිවැය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හේතුවෙන් 43.3% කින් වැඩි වී තිබුණි. ප්‍රගතිය හා පිරිවැය විස්තර පහත පරිදි වේ.

| උප ව්‍යාපෘති අංකය | පිරිවැය එ.ජ.ඩො. මිලියන | | භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| | ආරම්භක - 2006 | සංශෝධිත | |
| එච්ඩබ්ලිව් සහ ටී / යූඩබ්ලිව්එස්පීඒ 1 / බීඒටී / අයිසීබී | 35.81 | 51.93 | 88.6 |
| පීඩබ්ලිව් සහ ඊටී / යූඩබ්ලිව්එස්/පීසී1/ බීඒටී/ අයිසීබී | 16.46 | 24.73 | 87.0 |
| පීඩබ්ලිව් සහ ඊටී / යූඩබ්ලිව්එස් / පීසී 2 / එච්ඒඑම් / අයිසීබී | 7.94 | 11.0 | 98 |
| බීආර් / යූඩබ්ලිව්එස් / පීජ් 2 / එම්යූටී / එන්සීබී | 1.09 | 1.16 | 100 |
| පොලී හා වෙනත් ගාස්තු | 1.94 | 1.84 | |
| එකතුව | 63.24 | 90.66 | |

(ii) මඩකලපුවේ පෙර පිරිපහදුවේ ප්‍රධාන ජල සම්ප්‍රේෂණ හා ජල පවිත්‍රාගාර පිරියත කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රධාන වැඩ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු 2007 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර, නිම කිරීමේ දිනය 2011 මාර්තු දක්වා පසුව දීර්ඝ කර තිබුණි. 2011 මාර්තු 30 දිනට මෙම උප ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය 93% ක් පමණක් විය. ප්‍රමාණවත් වානේ ප්‍රමාණයක් නොසැපයීම , සම්පත් සැලසුම් කිරීමක් සිදු නොවීම, දුර්වල ව්‍යාපෘති කළමනාකරණය, ප්‍රමාණවත් තාක්ෂණ නිපුණතාවයකින් යුත් අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් නොවීම, ප්‍රමාදයන්ට ප්‍රධාන හේතූන් විය. කෙසේ වුවද , ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිට අනුව, ව්‍යාපෘති පිරිවැය සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් හිඟකම මේ සඳහා හේතු වී තිබුණි.